ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, අකුරේගොඩ පාර, බත්තරමුල්ල
இலங்கைத் தரைப்படைத் தலைமையகம், பாதுகாப்பு தலைமையகக் கட்டிடத் தொகுதி, அக்குரேகொடை வீதி, பத்தரமுல்லை
SRI LANKA ARMY HEADQUARTERS, DEFENCE HEADQUARTERS COMPLEX, AKUREGODA ROAD, BATTARAMULLA

මාධ්‍ය/ප්‍රචාර/**05/2026 (     )**

ප්‍රධාන කර්තෘ/ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ
ප්‍රවෘත්ති කළමණාකරු/සංස්කාරක

2026 පෙබරවාරි මස 04 දින

මාධ්‍ය නිවේදනය

යුද්ධ හමුදා මූලස්ථානය විසින් නිකුත් කරන ලද ප්‍රවෘත්ති නිවේදනය පහත සදහන් පරිදි වේ.

**අත්සන් කළේ:**

ඩබ්ලිව්එස් ගමගේ ආර්එස්පී යූඑස්පී
බ්‍රිගේඩියර්
යුද්ධ හමුදා මාධ්‍ය ප්‍රකාශක

**(මාධ්‍ය නිවේදනය)**

**78 වන ජාතික නිදහස් දිනයට සමගාමීව යුද්ධ හමුදාවේ කොමිෂන් නොලත් නිලධාරීන් වෙත නිල උසස්වීම් ලබාදීම**

78 වන ජාතික නිදහස් දිනයට සමගාමීව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ කොමිෂන් නොලත් නිලධාරීන් හා නිලධාරිණියන් **9158** දෙනෙකු හට **2026 පෙබරවාරි මස 04** වන දින සිට බලපැවැත්වෙන පරිදි නිල උසස් කිරීම් පිරිනමා ඇත.

ඒ අනුව බළලත් නිලධාරි II නිලයේ ජ්‍යෙෂ්ඨ කොමිෂන් නොලත් නිලධාරින් 260 දෙනෙකු බළලත් නිලධාරි I නිලයටත්, මාණ්ඩලික සැරයන් නිලයේ ජ්‍යෙෂ්ඨ කොමිෂන් නොලත් නිලධාරින් 1211 දෙනෙකු බළලත් නිලධාරි II නිලයටත්, සැරයන් නිලයේ ජ්‍යෙෂ්ඨ කොමිෂන් නොලත් නිලධාරින් 1704 දෙනෙකු මාණ්ඩලික සැරයන් නිලයටත්, කෝප්‍රල් නිලයේ කොමිෂන් නොලත් නිලධාරින් 2339 දෙනෙකු සැරයන් නිලයටත්, ලාන්ස් කෝප්‍රල් නිලයේ කොමිෂන් නොලත් නිලධාරින් 2204 දෙනෙකු කෝප්‍රල් නිලයට සහ සාමාන්‍ය සෙබලුන් 1440 දෙනෙකු ලාන්ස් කෝප්‍රල් නිලයටත් උසස්වීම් ලබා ඇත (නිමාව).